# මහනුවර සූරියගොඩ රජමහා විහාරය ආශ්‍රිතව සංචාරක ප්‍රවර්ධන සැලසුමක් සකස් කිරීම පිළිබඳ අධ්‍යයනයක්

එච්.එම්.ඩී.එස්. බණ්ඩාර

ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
Sugandibandara12@gmail.com

**මුඛ්‍ය පද** - සූරියගොඩ රජමහා විහාරය, පුරාවිද්‍යාව, සංචාරක ප්‍රවර්ධනය, කෞතුකාගාර, උරුම ප්‍රදර්ශනය.

## හැඳින්වීම

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟපළාත සූරියගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ සූරියගොඩ නරේන්ද්‍රාරාම රජමහා විහාරය පිහිටා තිබේ. කෝට්ටේ යුගයේ ඉදිකරන ලදැ යි සැලකෙන, මහනුවර යුගයේ වඩාත් ප්‍රසිද්ධ වූ මෙම විහාරය, ඒ වන විට දූෂිතව පැවති බුද්ධාගම යළි නගා සිටුවීමට කටයුතු කළ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ගේ පැවිදි භූමිය වීම විශේෂත්වයකි. ඓතිහාසික මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකමින් ද අගතැන්පත් මෙම විහාරයේ පවතින ටැම්පිට විහාරය, පැරණි පිළිමගෙය, මහනුවර යුගයට සහ යටත් විජිත සමයට අයත් චිත්‍ර, පැරණි ගෘහ නිර්මාණ ශිල්පය, කෞතුකාගාරය, කෞතුක භාණ්ඩ යනාදිය ඊට සාධක වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සූරියගොඩ රජමහා විහාරය ආශ්‍රිතව සංචාරක ප්‍රවර්ධන සැලසුමක් සකස් කිරීමයි. සූරියගොඩ විහාරයේ පවතින ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් සංචාරක ප්‍රවර්ධනය සඳහා උපයෝගී කරගන්නේ කෙසේද? යන්න විමසීම මෙම පර්යේෂණයේ ගැටළුව විය. ඒ අනුව මෙම ස්ථානයේ පවතින ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් උපයෝගී කරගෙන සංචාරක ආකර්ෂණය ලබාගැනීම පිළිබඳ පර්යේෂණය කර යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

පර්යේෂණයේ දී ගුණාත්මක සහ සංඛ්‍යාත්මක ක්‍රමවේද යටතේ දත්ත රැස් කරන ලදි. සූරියගොඩ විහාරය පිළිබඳ ලියැවී ඇති ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර, සංචාරක උරුම කළමනාකරණය පිළිබඳ ලියැවී ඇති සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කරන ලදි. සාහිත්‍ය විමර්ශනයෙන් පසුව ක්ෂෙත්‍ර අධ්‍යයනය සිදුකරන ලදි. පර්යේෂණයේ දී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අරමුණු වූ බැවින් ක්ෂෙත්‍ර පරීක්ෂණය, දත්ත ලබා ගැනීම සහ එම ක්ෂේත්‍ර දත්ත විමර්ශනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි. ක්ෂෙත්‍රයේ දී දත්ත ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා, පොලිස් නිළධාරීන් සහ ගම්වැසියන් සමඟ සාකච්ඡා පවත්වන ලදි. අවසානයේ දී සොයාගන්නා ලද දත්ත විශ්ලේෂණය කර නිගමනයන්ට එළඹෙන ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

සූරියගොඩ විහාරය වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ පැවිදි භූමිය වීම, මහනුවර යුගයේ රජවරුන්ගේ අනුග්‍රහය ලැබීම හා ඒ ආශ්‍රිත සිදුවීම් ද මෙම විහාරය ඓතිහාසික වශයෙන් වැදගත් වීමට හේතු වේ (ධීරානන්ද හිමි, වර්ෂය සඳහන් නොවේ: පි.1-3). ටැම්පිට විහාර සම්ප්‍රදායට අයත් වීම, පැරණි බිතුසිතුවම්, ගෘහ නිර්මාණ, කෞතුකාගාරය සහ කෞතුක වස්තු යනාදිය විහාරයේ පුරාවිද්‍යාත්මක වටිනාකම ඉස්මතු කරන සාධකයන් වේ. මෙම ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම්, කෞතුකාගාරය, මාර්ග පහසුකම් පැවතීම සහ එම ප්‍රදේශයේ වෙනත් සංචාරක කේන්ද්‍රස්ථාන දෙකක් පැවතීම යනාදිය විහාරය ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින අවස්ථාවන් වේ. නමුත් කෞතුකාගාරය නිසි පරිදි නඩත්තු නොවීම හා කළමනාකාරිත්වය දුර්වල වීම, ප්‍රජාව සහ

විහාරය අතර පවතින බැඳීම දුර්වල වීම මෙන්ම විහාරස්ථානයේ වටිනාකම ප්‍රමාණවත් ලෙස සමාජගත නොවීම යනාදී බාධකයන් ඒ සඳහා පවතියි.

විහාරස්ථානය ආකර්ෂණීය බවකින් තොර වීම කෙරෙහි විහාරස්ථානයේ කළමනාකාරිත්වය දුර්වල වීම හේතු වේ. එමෙන්ම උරුමය සම්බන්ධව කටයුතු කරන බලධාරීන් විසින් විහාරස්ථානය නිසි පරිදි නඩත්තු නොකිරීම හා සංරක්ෂණය නොකිරීම ද ඒ සඳහා බලපා තිබේ. කෞතුකාගාරය බොහෝ අවස්ථාවල වසා තැබෙන අතර, එය නිසි පරිදි නඩත්තු කරන බවක් දක්නට නොලැබේ. ඒ තුළට නිසි ලෙස වාතාශ්‍රය නොලැබේ. ප්‍රමාණවත් ආලෝකයක් ද නොමැත. කෞතුකාගාරය තුළ විවිධ සතුන් වාසය කරන බවට සාධක දැක ගැනීමට ලැබුණි. භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබෙන කුටීර, රාක්කවලට ගුල්ලන් විසින් හානි පමුණුවා ඇත. ඇතැම් කෞතුක වස්තූන් නිසි පරිදි නම් කිරීමක් සහ ප්‍රදර්ශනය කිරීමක් සිදුකර නොමැත. කෞතුකාගාරයේ ඇති පුස්කොළ පොත් එකතුව මෑතක දී ලේඛන ආරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නාමකරණය කර ඇත. කෞතුකාගාරය හා සම්බන්ධව ඉතා දුර්වල කළමනාකාරිත්වයක් පවතින බව දැකගත හැක. විහාරස්ථානයේ භාරකාරිත්වය පවතින්නේ භික්ෂූන් වහන්සේලාට සහ දායක පිරිසටයි. නමුත් ඔවුන්ගේ පවතින අනවබෝධය හෝ නොසැලකිල්ල හේතුවෙන් කෞතුකාගාරය නිසි පරිදි කළමනාකරණය කිරීම සිදු නොවේ. විහාරයට බහුලවම පිරිස පැමිණෙන්නේ පර්යේෂණ කටයුතු හෝ අධ්‍යාපනික කටයුතු සඳහා බවත්, විහාරය නැරඹීමට හා වන්දනා කිරීමට සංචාරකයන්ගේ පැමිණීම ඉතා අවම බවත් දැන ගැනීමට ලැබුණි. මීට ප්‍රධාන හේතුවක් වන්නේ විහාරස්ථානයේ ආකර්ෂණීය බවක් නොමැති වීම හා පාළු ස්වභාවයයි. සූරියගොඩ ආශ්‍රිතව ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථාන දෙකක් වන රණවන පුරාණ විහාරය සහ නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය පිහිටා තිබේ. මෙම ස්ථාන කරා සතිපතා විශාල සංචාරකයින් ප්‍රමාණයක් ඇදී එන අතර, එම පිරිස සූරියගොඩ විහාරය වෙත ද පහසුවෙන් ආකර්ෂණය කරගැනීමට මාර්ග පහසුකම් පවතී. නමුත් ගැටලුව වන්නේ විහාරයේ ඇති ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් ප්‍රමාණවත් පරිදි සමාජගත නොවීම, ආකර්ෂණීය බව අඩු වීම හා කළමනාකාරිත්වය දුර්වල වීමයි.

විහාරස්ථානයේ පවතින පාළු ස්වභාවය සහ ශාලා ඉඩකඩ ගැටලු හේතුවෙන් ප්‍රදේශයේ දරුවන් ඒ ආසන්නයේ පවතින වෙනත් දහම් පාසල් කරා යොමු වීමක් දක්නට ලැබේ. ඒ අනුව ප්‍රදේශයේ ජනතාව විහාරය සමඟ ඇති බැඳීම ඈත් වන ආකාරයක් නිරීක්ෂණය කළ හැක. මේ නිසා විහාරය හුදෙකලා වන අතර මේ අයුරින් ම පැවතියහොත් අනාගතයේ මෙහි වටිනාකම පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට පමණක් සීමා වනු ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ විහාරස්ථානය සහ ප්‍රජාව අතර සබඳතා තවදුරටත් වැඩිකරගත යුතු බවයි. විහාරස්ථානය තුළ කෞතුකාගාරයක් ඇති බව බොහෝ දෙනෙක් නොදනී. මේ නිසා විහාර භූමියේ සහ ආශ්‍රිත ප්‍රදේශයේ සෙනග ගැවසෙන ස්ථානයන්හි පුවරු ආධාරයෙන් කෞතුකාගාරය පිළිබඳව විස්තරාත්මක ප්‍රචාරයක් ලබා දීම වැදගත් වේ. උරුම සංචාරක ව්‍යාපාරය තුළින් ප්‍රජාවට ආර්ථික ප්‍රතිලාභ ලැබිය යුතුය. ක්ෂේත්‍රය ආශ්‍රිතව ග්‍රාමීය පරිසරයක් පවතින හෙයින් ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු වීම එම ප්‍රජාවේ ආර්ථිකය කෙරෙහි ද යහපත් ලෙස බලපානු ඇත.

සූරියගොඩ විහාරය වෙත සංචාරකයින් ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය සාධක බොහොමයක් පවතී. ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් පොහොසත් එම විහාරයෙහි වටිනාකම ප්‍රමාණවත් පරිදි සමාජගත නොවීම, විහාරයේ සහ කෞතුකාගාරයේ නඩත්තුව දුර්වල වීම, ආකර්ෂණීය බවකින් තොර වීම ඒ සඳහා ඇති බාධක වේ. සංචාරක ආකර්ෂණය ලැබීමට ඉතා සුදුසු මෙම ක්ෂේත්‍රය ආරක්ෂා කරගැනීම කෙරෙහි අදාළ බලධාරීන් ක්‍රියාත්මක විය යුතුය. මෙම විහාරස්ථානයට සංචාරක ආකර්ෂණය ලැබීම මඟින්

විහාරයේ ඓතිහාසික වටිනාකම ප්‍රසිද්ධියට පත්වන අතර, පුරාවිද්‍යාත්මක සාධකයන්හි වටිනාකම් වැඩි වීම සහ ප්‍රචලිත වීම මඟින් තවදුරටත් ඒවා ආරක්ෂා වීම සිදු වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ධීරානන්ද හිමි, හඟුරන්කෙත. (වර්ෂය සඳහන් නොවේ), ***වැලිවිට අසරණ සරණ සරණංකර සඟරාජයාණන් වහන්සේගේ ශාසනික වතින් ඓතිහාසිකත්වයට පත් සූරියගොඩ රජමහා විහාරය***, මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහනුවර.

රාජපක්ෂ, අරුණ. (2021), ***උරුම අධ්‍යයන ප්‍රවේශය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සුමංගල හිමි, පාහියංගල. (2020), ***සංස්කෘතික සංචරණ ප්‍රවේශය සහ සංචාරක වෙළඳපොළ කාණ්ඩ***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.